ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව |
| දිනය | 2018 අප්‍රේල් 16 |

## ශ්‍රී ලංකාව තුළ අතථ්‍ය මුදල් භාවිතය පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීම

ශ්‍රී ලංකාව තුළ හා ජාත්‍යන්තර වශයෙන් අතථ්‍ය මුදල් (virtual currencies) පිළිබඳව තිබෙන උනන්දුව වැඩි වෙමින් පවතින බව ශ්‍රී ලංකා මහ බැංකුවේ අවධානයට යොමු වී ඇත.

“අතථ්‍ය මුදල්” යන යෙදුම පොදුවේ භාවිතා වන්නේ, ඩිජිටල් තාක්ෂණය යොදා පෞද්ගලිකව නිකුත් කරන ලද වටිනාකම් සහිත ඒකකයන් වන අතර ඒවාට ආවේණික ගිණුම් ඒකක ද ඇත. අතථ්‍ය මුදල් සඳහා පොදු උදාහරණ වන්නේ බිට්කොයින් (Bitcoin), ලයිට්කොයින් (Litecoin) සහ එතීරියම් (Ethereum) වැනි අප්‍රකාශිත විද්‍යුත් මුදල් (Cryptocurrencies) ය. මෙම අතථ්‍ය මුදල් මහ බැංකු විසින් නිකුත් කරන මුදල් නොවේ.

අප්‍රකාශිත විද්‍යුත් මුදල් වැනි අතථ්‍ය මුදල්, ගනුදෙනු බලාත්මක කිරීම සඳහා පුද්ගලයන් ඍජුව සම්බන්ධ වී විමධ්‍යගත ලෙස සේවා සැපයිය හැකි වන අයුරින් ඩිජිටල් ජාල භාවිතා කරයි. එම මුදල්වල වටිනාකම පිළිබඳව සහතික කිරීමට සහ එම ගනුදෙනු නියාමනය කිරීමට මහ බැංකුව වැනි කේන්ද්‍රස්ථ අධිකාරියක් නොමැති වීම හේතුවෙන් ඒවා භාවිතා කරන්නන් අතර හෝ ගනුදෙනු ආශ්‍රිත ගැටලු ඇති වීමේ දී ඒ සඳහා මැදිහත්වන වගකිව යුතු පාර්ශ්වයක් නොමැත. අතථ්‍ය මුදල්වල වටිනාකම තීරණය වනුයේ සමපේක්ෂණ මත වන අතර එයට පාදක වූ වත්කම් හෝ ඒ සඳහා බලපවත්වන නියාමන රාමුවක් නොමැත. මේ නිසා ඒවායේ වටිනාකම විශාල වශයෙන් උච්චාවචනය විය හැක. ඒ හා සමානවම, නීතිවිරෝධී කටයුතු සඳහා අතථ්‍ය මුදල් භාවිතා කිරීමේ සම්භාවිතාවය ද ඉහළ යා හැකිය. තවද, අතථ්‍ය මුදල් භාවිතය මගින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට හා ත්‍රස්ථවාදයට අරමුදල් සැපයීම මැඩ පැවැත්වීමේ නීති උල්ලංඝනය වීමට ද අවකාශ ඇත. එම නිසා, වර්තමානයේ දී අප්‍රකාශිත විද්‍යුත් මුදල්

භාවිතා කිරීමෙන් පාරිභෝගිකයන්ට මෙන්ම රටෙහි ආර්ථිකයට ද මූල්‍යමය, මෙහෙයුම්, නීතිමය, පාරිභෝගික සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව යන අංශවලින් සැලකිය යුතු අවදානමක් ඇති කරයි.

ශ්‍රී ලංකා මහ බැංකුව කිසිදු ආයතනයකට හෝ සමාගමකට අප්‍රකාශිත විද්‍යුත් මුදල් ඇතුළු අතථ්‍ය මුදල් සම්බන්ධව ක්‍රියාමාර්ග ගැනීමට බලපත්‍ර ලබාදී හෝ බලය පැවරීමක් කර නොමැති බව සහ කිසිදු ආයතනයකට මූලික කාසි අර්පණයන් (Initial Coin Offerings-ICOs) සඳහා බලය පැවරීමක් කර නොමැති බව ද මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.